අ.පො.ස. උසස් පෙළ

# ව්‍යාපාර අධ්‍යයනය I

Channel NIE

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය**

ව්‍යාපාර අධ්‍යයනය I

කාලයඃ පැය දෙකයි

විභාග අංකය : ...................................

උපදෙස්:

- **සියලු** ම ප්‍රශ්නවලට පිළිතුරු **මෙම ප්‍රශ්න පත්‍රයේ** ම සපයන්න.
- **විභාග අංකය,** ඉහළින් ඇති කොටුවේ පැහැදිලිව සටහන් කරන්න.
- ප්‍රශ්න අංක 1 සිට 30 තෙක් වූ ප්‍රශ්නවලට නිවැරදි පිළිතුරු තෝරා, එහි අංකය ප්‍රශ්නය ඉදිරියෙන් ඇති ඉර මත ලියන්න.
- ප්‍රශ්න අංක 31 සිට 50 තෙක් වූ ප්‍රශ්නවලට කෙටි පිළිතුරු අදාළ තිත් ඉර මත ලියන්න.
- සෑම ප්‍රශ්නයකට ම ලකුණු **දෙක** බැගින් හිමි වේ.

## ලකුණු දීමේ පටිපාටිය

1 පත්‍රය

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 01 | 2 |
| 02 | 5 |
| 03 | 3 |
| 04 | 5 |
| 05 | 2 |
| 06 | 1 |
| 07 | 3 |
| 08 | 1 |
| 09 | 4 |
| 10 | 3 |

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 11 | 4 |
| 12 | 5 |
| 13 | 3 |
| 14 | 2 |
| 15 | 3 |
| 16 | 4 |
| 17 | 2 |
| 18 | 4 |
| 19 | 5 |
| 20 | 3 |

| ප්‍රශ්න අංකය | පිළිතුරු අංකය |
|---|---|
| 21 | 2 |
| 22 | 3 |
| 23 | 3 |
| 24 | 1 |
| 25 | 4 |
| 26 | 5 |
| 27 | 3 |
| 28 | 4 |
| 29 | 1 |
| 30 | 4 |

**අංක 31 සිට 50 දක්වා සෑම පිළිතුරකට ම ලකුණු X බැගින් හිමි වේ.**

31) (අ) භාණ්ඩ/සේවා
    ආ) ආසන්න පරිසරය / බාහිර පරිසරය

32) (අ) සමාජය/ගනුදෙනුකරුවෝ
    (ආ)ඍජු බදු / වක්‍ර බදු

33) (අ) සංස්ථාගත කිරීමක් (සංස්ථාපනයක්)/ සංස්ථාගත කිරීමක් (සංස්ථාපනයක්)
    (ආ)අන්‍යෝන්‍ය නියෝජිත්වය / ලිඛිත ගිවිසුමක්

34) (අ) නිෂ්පාදකයා/ පාරිභෝගිකයා
(ආ) ආනයනකරු/ණයවර ලිපිය

35) (අ) නායකත්වය /මෙහෙයවීමේ
(ආ) උපාය මාර්ග / වැඩසටහන්

36) (අ) සමාන කාර්යක/නිෂ්පාදන ක්‍රියාවලිය
(ආ) උපරිම තොග භාවිතය/ උපරිම ඇණවුම් කාලය

37) (අ) අයිතිකර ගන්නා ලද මාධ්‍ය/ උපයන ලද මාධ්‍ය
(ආ) ඍජු අලෙවිකරණය / ඉසවු හා අත්දැකීම්

38) (අ) දිගු කාලින ආයොජන තීරණ/ කෙටි කාලින ආයොජන තීරණ
(ආ) තැරැව්කාර සමාගම් /අතරමැදියන්

39) (අ) පෞරුෂ /ප්‍රායෝගික
(ආ) කඩාකප්පල් කිරීම/උපවාසය

40) (අ) ව්‍යාපාර බුද්ධි තොරතුරු පද්ධති - Business Intelligence Systems (BIS) / තීරණ උපකාරක පද්ධති
(ආ) කර්මාන්ත හා වෙළෙඳපොළ/ විකුණුම් පුරෝකථනය

41)
1. තිරසර සංවර්ධනය
2. සමානාත්මතාව
3. සමාජ තිරසර සංවර්ධනය
4. ජීවත්විය හැකි බව

42)

| ලක්ෂණ | පෞද්ගලික අංශය | පොදු අංශය |
|---|---|---|
| ලැස්තුගත කළ හැකි | 1. සීමිත පොදු සමාගම් | 2. රාජ්‍ය සමාගම්/ රාජ්‍ය සංස්ථා |
| නෛතික පුද්ගලභාවයක් නොමැති | 3. තනි/හවුල් | 4. රාජ්‍ය දෙපාර්තමේන්තු |

43)
1. තමාගේ ම අදහසක් හෝ නව සංකල්පයක් අනුව ව්‍යාපාරික කටයුතු ඇරඹීම.
2. ව්‍යාපාරික ප්‍රතිවාදියා තමා ම වීම.
3. නව ව්‍යාපාර අවස්ථා සඳහා සූදානම් වෙයි.
4. නවෝත්පාදකයෙකි.
5. අවදානම්වලට මුහුණ දෙයි.
6. ගැටලු පිටුදැකීමට ධෛර්යමත්ව කටයුතු කරයි.

44)
1. ග්‍රාමීය කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය
2. ශ්‍රී ලංකා මහ බැංකුව
3. ජන හා සංඛ්‍යා ලේඛන දෙපාර්තමේන්තුව
4. කර්මාන්ත සංවර්ධන අමාත්‍යාංශය

45)

1. නෛතික බැඳීමක් ඇති කර ගැනීමේ අදහස.
2. අර්පනය හෙවත් යෝජනාව.
3. ප්‍රතිග්‍රහණය හෙවත් පිළිගැනීම.
4. නෛතික බව. (නීතියට එකඟ බව)
5. ඒ ඒ පාර්ශ්වයන්ට නෛතික බැඳීමක් ඇති කර ගැනීමට ඇති හැකියාව.
6. ප්‍රතිෂ්ඨාව හෙවත් මුදල් අගයක් තිබීම.

46)

| තනතුර මත ලැබෙන බලය | පුද්ගලයා මත රඳා පවතින බලය |
|---|---|
| නීත්‍යානුකූල බලය | විශේෂඥ බලය |
| ත්‍යාග දීම සඳහා ඇති බලය | බලපෑම් කිරීමේ බලය |
| දඬුවම් දීමට ඇති | |

47)

| යන්ත්‍ර ඵලදායිතාව | ශ්‍රම ඵලදායිතාව |
|---|---|
| 1. දියුණු තාක්ෂණය සහිත උපකරණ සහ යන්ත්‍ර යොදා ගැනීම. | 1. පුහුණු සේවකයන් යොදා ගැනීම. |
| 2. අබලන් නොවූ යන්ත්‍ර යොදා ගැනීම. | 2. සේවකයන් පුහුණු කිරීම. |
| 3. යන්ත්‍ර සූත්‍ර නිසි පරිදි නඩත්තු කිරීම. | 3. මූල්‍ය හා මූල්‍ය නොවන සේවක දිරිගැන්වීම යොදා ගැනීම. |
| | 4. තත්ත්ව කව යොදා ගැනීම. |
| | 5. මනා සේවක සම්බන්ධතා පවත්වා ගැනීම. |

48)

1. ප්‍රචාරණය
2. විකුණුම් ප්‍රවර්ධනය
3. පෞද්ගලික විකුණුම්
4. මහජන සම්බන්ධතා
5. ඍජු අලෙවිකරණය
6. ඉසවු හා අත්දැකීම්

49)

1. පැවතිය හැකි මුළු පුරප්පාඩු සංඛ්‍යාව (සිටින සේවකයින් - පිටතින් ලබා ගත හැකි සේවකයින්)
2. අවශ්‍ය සේවකයින්ගේ තත්ත්වය (පුහුණු/නුපුහුණු/අර්ධ පුහුණු/අනියම්/ස්ථිර)
3. මානව සම්පත් අවශ්‍ය වන කාලසීමාව
4. අවශ්‍ය වන සේවක වර්ග (කළමනාකරුවන්/ලිපිකරුවන්/රියදුරන්/කම්කරුවන්)

50)

1. ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිසම
2. ශ්‍රී ලංකා රේගු දෙපාර්තමේන්තුව
3. පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරිය
4. ශ්‍රී ලංකා ප්‍රමිති ආයතනය

**අධ්‍යයන පොදු සහතික පත්‍ර උසස් පෙළ විභාගය සඳහා වූ පෙරහුරු පරීක්ෂණය**

වයාපාර අධ්‍යයනය II | කාලය: පැය තුනයි

උපදෙස්:
❖ එක් කොටසකින් අවම වශයෙන් ප්‍රශ්න **දෙක** බැගින්වත් තෝරාගෙන, ප්‍රශ්න **පහකට** පිළිතුරු සපයන්න.

## ලකුණු දීමේ පටිපාටිය

II පත්‍රය

01) (i) (අ) මෙහි දී අත්‍යවශ්‍ය ම දෙයක් යනු මිනිස් අවශ්‍යතාවක් වන කුසගින්න සඳහා භාවිත වන ආහාර පානයි. ඒ සඳහා රුක්ෂාන් විසින් සකස් කරන ලද ආහාර පාන විවිධ ස්වරූපයෙන් එනම් පාරිභෝගික වුවමනාවන් අනුව සපුරාලයි.
නිදසුන්: බත්, පාන්, රොටී, ඉඳිආප්ප, සුප්

(ආ) රුක්ෂාන් විසින් භෝජනාගාරයක් පවත්වා ගෙන යාම සේවා නිෂ්පාදිතයක් ලෙසත් ඔහුගේ බේකරි නිෂ්පාදිත භාණ්ඩ ලෙසත් දැක්විය හැකි ය. තව ද භෝජනාගාරයේ කෑම බීම නිෂ්පාදිත ලෙස ලබා ගනුලැබුව ද රුක්ෂාන් විසින් සිදු කරනු ලබන්නේ සේවා වෙළෙඳාමකි. ඔහුගේ බේකරියේ ඔහු නිෂ්පාදිතයක් බිහි කරමින් ඒවා විකුණනු ලබයි. ඒවා සියල්ල එම ස්ථානයේ දී පාරිභෝජනය සිදු නොවේ.

- මෙය වෙනත් ලෙසකට ද පිළිතුරු සැපයීමට හැකි ය. අප දළ දේශීය නිෂ්පාදිතය තුළ දී වෙළෙඳාම සේවා අංශය ද ආහාර ද්‍රව්‍ය නිෂ්පාදනය කාර්මික නිෂ්පාදන අංශය ද නියෝජනය කරන හෙයින් එය භාණ්ඩ නිෂ්පාදිතයක් ලෙස සැලකිය හැකි ය.

(ii)

| යෙදවුම් සම්පත් | ක්‍රියාවලිය | නිමවුම් |
|---|---|---|
| භූමිය:<br>බේකරියට අයත් ඉඩම | නිෂ්පාදනය: අමුද්‍රව්‍ය සපයා ගැනීමේ සිට නිෂ්පාදිතය ලැබෙන තෙක් සිදුවන ක්‍රියාදාමය. | බේකරි නිෂ්පාදිත<br>පාන්<br>බනිස්<br>කේක්<br>වියනා රෝල්<br>ස්පන්ච් |

| | | |
|---|---|---|
| ශ්‍රමය: එක් පිළිස්සීමකට සහභාගි වන සියලු පිරිස | ද්‍රව්‍ය සපයා ගැනීම, ද්‍රව්‍ය ලබා ගැනීම, වර්ග කිරීම, මිශ්‍ර කිරීම, අවශ්‍ය පමණ පිළිස්සීම, නියමිත අවස්ථාවේ දී නිෂ්පාදිත පෝරණුවෙන් ගැනීම ආදිය | |
| ව්‍යවසායකත්වය : අයිතිකරු හෙවත් සාධක සංයෝග කරන්නාගේ හැකියාව | අලෙවිකරණ අලෙවි ප්‍රවර්ධනය, බෙදාහැරීම, මිල නියම කිරීම, නිෂ්පාදිතයේ මානව සම්පත් කටයුතු | |
| ප්‍රාග්ධනය: ගොඩනැගිල්ල, පෝරණුව,තැටි | සේවකයන් බඳවා ගැනීම<br>සේවකයන්ට අදාළ ලිපිගොනු පවත්වා ගෙන යාම<br>විනය කටයුතු, පුහුණු කටයුතු ආදිය | |
| තොරතුරු: නව ශිල්පීය ක්‍රම, වෙළෙඳසැලේ තොරතුරු | මූල්‍ය කටයුතු<br>මුදල් සම්පාදනය<br>මුදල් යෙදවීම<br>පර්යේෂණ හා සංවර්ධන කටයුතු<br>මේ නමින් නිෂ්පාදිත පිළිබඳ සොයා බලා අඩුපාඩු සැකසීම<br>නව බේකරි නිෂ්පාදන ක්‍රම, නව නිෂ්පාදිත වර්ග, ගුණත්වය, පාරිභෝගික රැස්වීම්, වෙළෙඳපොළ ආදිය පිළිබඳ ගැඹුරින් අධ්‍යයනය කිරීම | |
| කාලය: සේවකයින් වැඩ කරන කාලය, සේවා මුරය/නිෂ්පාදන යට ගත වන කාලය | | |
| දැනුම: නව ක්‍රම භාවිතය පිළිබඳ හැකියාව, වෙළෙඳපොළ භාවිත ආදිය | | |

(ආ) - ප්‍රවාහනය (බෙදාහැරීමේ කටයුතු)

- සන්නිවේදනය (සේවකයන් බඳවා ගැනීමට පුවත්පතක දැන්වීමක් පළ කිරීම)

(iii)

| පාසලේ අභ්‍යන්තර පාර්ශ්ව | බාහිර පාර්ශ්ව |
| --- | --- |
| විදුහල්පති | දෙමාපියන් |
| නියෝජ්‍ය විදුහල්පති | ප්‍රජාව |
| සහකාර විදුහල්පති | අනෙකුත් අවට පාසල් |
| අංශ ප්‍රධානීන් | රජය |
| පන්ති භාර ගුරුවරුන් | |
| අනෙකුත් සේවකයන් | |
| පාසල් සිසුන් | |

(iv) (අ) ආර්ථික තිරසර සංවර්ධනය
පරිසර තිරසර සංවර්ධනය
සමාජ තිරසර සංවර්ධනය
ව්‍යාපාරයකට ගත හැකි ක්‍රියාමාර්ග

**ව්‍යාපාරයකට ආර්ථික තිරසර සංවර්ධනය තහවුරු කිරීමට ගත හැකි ක්‍රියාමාර්ග**

- රැකියා නිර්මාණය
- සම්පත් කාර්යක්ෂම ව භාවිතය
- ප්‍රාග්ධනය කාර්යක්ෂම ව භාවිතය
- අවදානම් කළමනාකරණය
- ආර්ථික වර්ධනය බලගැන්වීම
- කුසලතා බලගැන්වීම
- නවෝත්පාදන හඳුන්වා දීම
- තාක්ෂණය දියුණු කිරීම
- යටිතල පහසුකම් සංවර්ධනය
- නිෂ්පාදන ක්‍රියාවලිය දිරිගැන්වීම

**ව්‍යාපාරයකට පාරිසර තිරසර බව සඳහා ගත හැකි ක්‍රියාමාර්ග**

- පරිසර හිතකර දෑ මිලට ගැනීම
- අපද්‍රව්‍ය මනා ලෙස කළමනාකරණය කිරීම, 3R, 4R, 5R සංකල්ප ක්‍රියාත්මක කිරීම
- පරිසර හිතකාමී ප්‍රවාහන ක්‍රම භාවිතය
- රාජකාරී ද්‍රව්‍ය ආරක්ෂිත ව පරිහරණය
- ජෛව විවිධත්වය රැකීමට කටයුතු කිරීම
- පාරිසරික නීති රීතිවලට අනුගත ව කටයුතු කිරීම
- පාරිසරයක හිතකාමී බලශක්ත භාවිතය

**ව්‍යාපාරයකට සමාජ හා සංස්කෘතික තිරසර බව තහවුරු කිරීම සඳහා ගත හැකි ක්‍රියාමාර්ග**

- මානව විවිධත්වයට ගරු කොට කටයුතු කිරීම
- මානව අයිතිවාසිකම් සුරැකීම
- අධ්‍යාපනය, සෞඛ්‍ය, ප්‍රවාහනය ආදී පහසුකම් සඳහා දායක වීම
- සමාජ සංරක්ෂණ කටයුතුවලට දායක වීම
- නීතිය හා සාමය සුරැකීමට දායක වීම

(ආ) 1. අයිතිකරුගේ පෞද්ගලික මතවාද තම මාධ්‍යයෙන් ප්‍රවර්ධනය නොකිරීම හා ස්වාධීන මත දැරීම
2. සියලු ජාතීන් ආගම් පිළිබඳ කරුණු දැක්වීමේ දී සමානාත්මතාවයෙන් යුතු ව කටයුතු කිරීම
3. තරගකරුවන් තම සහෝදර ආයතන සේ සලකා කටයුතු කිරීම
4. සමාජයෙහි මුල් බැසගත් විශ්වාස, ප්‍රතිමාන, චාරිත්‍ර ඒ අයුරින් ම සුරැකීම
5. සේවක සුරක්ෂිතතාව සුරැකීම හා ඔවුන් තම ව්‍යාපාරයේ ක්‍රියාකාරකම් මත සිදු වන සියලු හානි පූර්ණය කිරීම

(v) (අ) තෝරා ගැනීමට ඇති අයිතිය

(ආ) පාරිභෝගික කටයුතු පිළිබඳ අධිකාරියේ සභාපති, අධ්‍යක්ෂ ජනරාල්
සෞඛ්‍යය අමාත්‍යාංශය, සෞඛ්‍ය සේවා අධ්‍යක්ෂ ජනරාල්, මහජන සෞඛ්‍ය පරීක්ෂක

02) (i) (අ) රජයේ මූල්‍ය ප්‍රතිපත්තිය ක්‍රියාත්මක කිරීම සඳහා යොදා ගනු ලබන ප්‍රධාන උපකරණය ප්‍රතිපත්තිමය පොලි අනුපාතිකය යි. මෙය නිත්‍ය තැන්පතු පහසුකම් අනුපාතිකය (SDFR) සහ නිත්‍ය ණය පහසුකම් අනුපාතිකය (SLFR) යනුවෙන් කොටස් දෙකකි.

(ආ) වාණිජ බැංකු ණය පොලී අනුපාතිය ඉහළ නැංවීම නිසා ව්‍යාපාරිකයින් වාණිජ බැංකුවලින් ලබා ගන්නා ණය ප්‍රමාණය අඩුවීම නිසා ආයෝජනය හා නිෂ්පාදනය අඩු වී භාණ්ඩවල මිල වැඩි වී පිරිවැටුම අඩු වීම සහ ලාභය අඩු වේ.
හෝ
පොලිය වැඩි වීම නිසා මූල්‍ය සම්පාදනයේ දී වැඩි පිරිවැයක් දැරීමට සිදු වීමෙන් භාණ්ඩවල මිල ඉහළයාම නිසා ඉල්ලුම අඩු වී ලාභය අඩු වේ.

(පැහැදිලි කිරීමට ලකුණු 02 යි)

(ii) 1. තෝරා ගැනීමේ අයිතිය ලබා දීම.
2. තොරතුරු දැන ගැනීමේ අයිතිය ලබා දීම.
3. සවන් යොමු කර ගැනීමේ අයිතිය ලබා දීම.
4. ගුණත්වයෙන් යුතු ඉහළ ප්‍රමිතියෙන් යුතු නිෂ්පාදිත ලබාදීම.
5. වෙළෙඳ විෂමාචාරවලින් තොරව ව්‍යාපාර කටයුතු සිදු කිරීම.
6. පරිසරය ආරක්ෂා වන අයුරින් කටයුතු කිරීම.

(කරුණු 4ට ලකුණු 02යි)

(iii)(අ) 1. ස්වාධීන සංවිධානයක් බව
2. ස්වෙච්ඡාවෙන් එක් වූ පුද්ගල සමූහයක් සිටීම.
3. සාමාජිකයන්ගේ සාමූහික අයිතිය
4. ප්‍රජාතන්ත්‍රවාදී පාලනය

(ඉහත ලක්ෂණ ඇතුළත් ගැළපෙන අර්ථකථනයකට ලකුණු 02)

(ආ) 1. අත්‍යවශ්‍ය භාණ්ඩ සාධාරණ මිලකට විකිණීම.

2. සෑම පාරිභෝගිකයෙකුට ම ලැබෙන සේ සාධාරණ ව බෙදාහැරීම.

3. පාරිභෝගික අයිතිවාසිකම් සුරැකෙන අයුරින් කටයුතු කිරීම.

4. විද්‍යුත් ක්‍රම හරහා මිලදී ගැනීමට අවස්ථාව සැලසීම.

5. තත්වයෙන් උසස් සේවාවක් සැපයීම. **(කරුණු 2ට ලකුණු 02යි)**

(iv) (අ) ඒකාබද්ධ වීම

(ආ) 1. තරගකාරිත්වයට මුහුණදිමට හැකි වීම

2. ව්‍යාපාරයේ අත්දැකීම් හුවමාරු කර ගත හැකි වීම

3. වෙළෙඳපොළ කොටස වර්ධනය වීම

4. මූල්‍ය දුෂ්කරතාවලට ශක්තිමත් ව මුහුණදීමට හැකිවීම

5. පිරිවැය වාසි ලබාගත හැකි වීම **(කරුණු එකකට ලකුණු ½ බැගින් ලකුණු 02යි)**

(v) (අ)

| ව්‍යාපාරයේ නම | ව්‍යාපාර සංවිධාන වර්ගය |
|---|---|
| විල්සන් සහ සමාගම | හවුල් ව්‍යාපාර |
| නිල්මිණි ස්ටෝර්ස් | තනි ව්‍යාපාර |
| අරුණලු පී එල් සී | ලැයිස්තුගත පොදු සමාගම් |
| සී/ස සඳකැළුම් (පෞද්.) සමාගම | පෞද්ගලික සමාගම් |

**(ලකුණු ½ x 4= ලකුණු 02යි)**

(ආ) 1. සමාගම් පනත යටතේ සංස්ථාපනය කර ඇති සමාගමක් වීම.

2. සමාගමේ මුළු ප්‍රාග්ධනයෙන් 51% වැඩි ප්‍රතිශතයක් රජය හෝ රාජ්‍ය ආයතන සතු වීම.

**(කරුණු එකකට ලකුණු 01 බැගින් ලකුණු 02යි)**

03) (i) (අ) 1. කැපවීම

2. ස්වාධීන බව (මෙම ලක්ෂණ දෙක පමණි)

(ආ) නායකත්ව කුසලතා

(ඉ) 1. ව්‍යවසායකත්ව නිපුණතා නිශ්චිත ව හඳුනා ගැනීම

2. නිපුණතා තමා තුළ කොතෙක් දුරට පවතී ද?

3. තමා තුළ නැති නිපුණතා

4. තවදුරටත් සංවර්ධනය කර ගත යුතු නිපුණතා

(ii) (අ)

| | | |
|---|---|---|
| සිතුම් | මූල්‍ය පහසුකම් | ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය<br>ජාතික සංවර්ධන බැංකුව<br>ප්‍රාදේශීය සංවර්ධන බැංකුව |
| සෙත්මිණ | තාක්ෂණික දැනුම | කාර්මික සංවර්ධන මණ්ඩලය<br>කාර්මික තාක්ෂණික ආයතනය |
| නයනජිත් | උපදේශන සේවා | කාර්මික සංවර්ධන මණ්ඩලය<br>ජාතික ව්‍යවසාය සංවර්ධන අධිකාරිය |
| රවිශාන් | අලෙවි පහසුකම් | අපනයන සංවර්ධන මණ්ඩලය<br>ජාතික හස්ත කර්මාන්ත මණ්ඩලය |

**(නම් කිරීමකට ලකුණු ½ බැගින් ලකුණු 02යි)**

(iii)(අ) 1. වටිනාකමේ මිණුම් දණ්ඩක්
2. හුවමාරු මාධ්‍යයක්
3. කල්පසු වූ ගෙවුම් මාධ්‍යයක්
4. වටිනාකමේ සන්නිධියක් (ලකුණු 02)

(ආ) 1. සාපේක්ෂ ව ඉහළ පොලී ප්‍රතිශතයක් ලැබීම.
2. එකවර ම මුලු මුදල ම ලබා ගත හැකි වීම.
3. අවශ්‍ය නම් පොලිය අවශ්‍ය නම් ලබා ගත හැකි ය.
4. ස්ථාවර තැන්පතුව ඇපයට තබා කිසියම් ප්‍රතිශතයක් ණය ලෙස ලබා ගත හැකි වීම.
5. ඇප ආවරණයක් ලෙස ඉදිරිපත් කළ හැකි වීම.
6. වෙනත් සුවිශේෂ ප්‍රතිලාභ (රක්ෂණාවරණ, ත්‍යාග ලබා දීම)

**(එක් කරුණකට ලකුණු ½ බැගින් ලකුණු 02යි)**

(iv) (අ) 1. ස්වයංක්‍රීය යන්ත්‍ර (ATM) මගින් ජංගම ගිණුමේ ඇති මුදල් ලබා ගැනීමට හැකි වීම.
2. අදාළ බැංකුව ලබා දී ඇති පරිගණක මෘදුකාංග පහසුකම භාවිත කර ජංගම ගිණුමේ ඇති මුදල් පරිහරණය කිරීමේ හැකියාව.

(ආ) 1. තමාගේ ගිණුමේ ඇති මුදල් එම බැංකුවේ ම තමාගේ වෙනත් ගිණුමකට මාරු කිරීම
2. තමාගේ ගිණුමේ ඇති මුදල් එම බැංකුවේ ඇති වෙනත් අයෙකුගේ ගිණුමකට මාරු කිරීම
3. වෙනත් බැංකුවක ඇති ගිණුමකට මුදල් මාරු කිරීම
4. විවිධ බිල්පත් ගෙවීම (ලකුණු 02)

(අ) 1. ඒක්ක භාරකරු

2. අරමුදල් කළමනාකරණ සමාගම

3. ඒකක හිමියන් හෙවත් ආයෝජකයන්

ඒකක භාරයක් යනු ආයෝජකයන්ට ඒකක විකිණීමෙන් රැස් කර ගන්නා මුදල්වලින් සමන්විත ආයෝජන අරමුදලකි. මෙහි රැස් කරගත් අරමුදල් වෘත්තීය අරමුදල් කළමනාකරුවන් විසින් ආයෝජන කළඹක ආයෝජනය කරයි. එහි ප්‍රතිලාභ ඒකක භාරයේ ඒකක මිල දී ගත් ආයෝජකයන් අතරේ බෙදා හරිනු ලැබේ.

(ආ) <u>**පක්ෂව**</u>

1. දවසේ පැය 24 පුරාම ගනුදෙනු කළ හැකි වීම.
2. විවිධ ප්‍රතිලාභ හිමි වේ.
3. විදේශ ගනුදෙනු සඳහා ද භාවිත කළ හැකි වීම.
4. ගෙවීම් කටයුතු පහසු වීම.

<u>**විපක්ෂව**</u>

1. පොලී, ප්‍රමාද ගාස්තු වැනි පිරිවැය දැරීමට සිදු වීම.
2. වංචනික ක්‍රියා සිදු වීම
3. අනවශ්‍ය පාරිභෝජන රටාවකට හුරු වීම.
4. තාක්ෂණික දෝෂ නිසා ගනුදෙනුවලට බාධා වීම.

04) (i) (අ)

| රක්ෂණ වර්ගය | ගිවිසුමට එළඹෙන අවස්ථාවේ දී | වන්දි ලබා ගන්නා අවස්ථාවේ දී |
|---|---|---|
| ජීවිත රක්ෂණය | √ | × |
| සමුද්‍රිය රක්ෂණය | × | √ |
| දේපළ රක්ෂණය | √ | √ |

(තුන ම නිවැරදි නම් ලකුණු 02)

(දෙකක් නිවැරදි නම් ලකුණු 01)

(එකක් පමණක් නම් ලකුණු නැත)

(ආ)අවම තෙවන පාර්ශ්ව රක්ෂණය

(ii) (අ) 1. තොරතුරු දෙන්නා හා ලබන්නා සම්මුඛ වීම.

2. තොරතුරු ඉතා ඉක්මණින් හා රහසිගත ව ඉදිරිපත් කළ හැකි වීම.

3. ගැටලුවක් වඩාත් විස්තරාත්මක ව ඉදිරිපත් කොට, සාකච්ඡා කොට ඉදිරිපත් කළ හැකි වීම.

4. ඉරියව්, හැඟීම්, අංග චලනය, හඬ හැසිරවීම යොදා ගනිමින් ප්‍රබල සන්නිවේදනයක් කළ හැකි වීම.

(4 x 1/2 = ලකුණු 02)

(ආ)1. දෘෂ්ඨි ගැටලු හා ඌනතා ඇති පාර්ශ්ව සමග තොරතුරු හුවමාරු කර ගැනීමේ ගැටලු ඇති වීම.

2. සංඥා හා සංකේත විකෘති වී යාමෙන් තොරතුරු සන්නිවේදනයට බාධා ඇති වීම.

3. සමහර සංඥා හා සංකේත අවබෝධ කර ගැනීමට අපහසු වීම.

4. සංඥා හා සංකේත අවබෝධ කර ගැනීමට පෙර ඒවා පිළිබඳ දැනුම අවශ්‍ය වීම.

5. ඇතැම් සංකේත වැරදි ලෙස තේරුම් ගැනීම.

6. විස්තරාත්මක පණිවුඩ සඳහා යෝග්‍ය නොවීම. (4x1/2 = ලකුණු 02)

(iii)(අ)

| කරුණු | නිදසුන් |
|---|---|
| ප්‍රධාන සම්බන්ධතාවලට ආසන්න බව | අධිවේගී මාර්ගයකට ආසන්නව |
| ගබඩාව තුළ කලාප වෙන් කිරීම | ගබඩාව තුළ ස්ථාන වෙන් කර |
| ගබඩා කරන ද්‍රව්‍යයේ ස්වභාවය | නියමිත උෂ්ණත්වය, තෙතමනය රැකෙන පරිදි |
| ද්‍රව්‍ය එහා මෙහා කිරීමේ හැකියාව | ඇසුරුම් එහා මෙහා කිරීම සඳහා උපකරණ භාවිත කිරීම |

(කරුණු හා නිදසුන් 4 ම නිවැරදි නම් ලකුණු 02)

(කරුණු හා නිදසුන් 3ක් නිවැරදි නම් ලකුණු 1 1/2)

(කරුණු හා නිදසුන් 2ක් නිවැරදි නම් ලකුණු 01)

(කරුණු හා නිදසුන් 1ක් නිවැරදි නම් ලකුණු 1/2)

(ආ) 1. ගබඩාව වඩාත් සංවිධානාත්මක බව.

2. අසුරන ලද නිෂ්පාදිතවලට හා සේවකයන්ට ආරක්ෂාකාරී වීම.

3. දැරිය යුතු පරිශ්‍රමය හා කාලය ඉතිරි වීම.

4. ගබඩාවේ ඉඩකඩ ඉතිරි වේ. (4 x 1/2 = ලකුණු 02)

(iv) (අ) කිසිදු බාධාවකින් තොරව විවිධ පාර්ශ්වයන්ට නිදහසේ භාණ්ඩ ආනයනය හා අපනයනය කිරීමට අවකාශයක් සැලසීමයි. **(ඉරි ඇඳි පද සහිත අර්ථ දැක්වීමට ලකුණු 02යි)**

(ආ) 1. ආනයන සීමා කිරීම / පංගු කිරීම

2. අපනයන සීමා කිරීම / පංගු කිරීම

3. ආනයන/අපනයන තහනම් කිරීම

4. වෙළෙඳ ගිවිසුම්

5. දැඩි විනිමය ප්‍රතිපත්ති (4 x 1/2 = ලකුණු 02)

(v) (අ) 1. තොග සම්බන්ධ පිරිවැය අවම වීම.

2. ලිපි ද්‍රව්‍ය පිරිවැය අවම වීම.

3. සන්නිවේදන පිරිවැය අවම වීම.

4. අතරමැදියන් අවම වීම නිසා පිරිවැය අවම වීම.

(කරුණු දෙකක් කෙටියෙන් විස්තර කිරීමට ලකුණු 02)

(ආ) a. සනීපාරක්ෂක සහතිකය

b. හානි රක්ෂණ ලිපිය (1 x 2 ලකුණු 02)

05) (i) (අ) 1. පුද්ගලයින්ගේ අපේක්ෂාවන් බලාපොරොත්තු වූ ආකාරයට ම ඉෂ්ට කර ගැනීමට.

2. පුද්ගලයින්ගේ ආර්ථික තත්ත්වය (ආදායම්, වියදම්) මනා ලෙස පාලනය කර ගැනීමට.

3. කාලය කළමනාකරණය කර ගැනීමට.

4. කාර්යක්ෂමතාව වර්ධනය කර ගැනීමට. (4 x 1/2 = ලකුණු 02)

(ආ) ආයතනයක් දිගු කාලයක දී ළඟා කර ගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල පරමාර්ථ වන අතර කෙටි කාලයක් තුළ අත්පත් කර ගැනීමට අපේක්ෂිත ප්‍රතිඵල අරමුණු වේ.

(පරමාර්ථ හා අරමුණු කෙටියෙන් හැඳින්වීමට ලකුණු 01)

පරමාර්ථ ඉටු වන ආකාරයට අරමුණු ගොඩනගා ගත යුතු අතර අරමුණු ඉටුවීමෙන් පරමාර්ථ ඉටුකර ගත හැකි ය. (සම්බන්ධතා දැක්වීමට ලකුණු 01)

(ii) (අ)
- දැක්ම, මෙහෙවර, පරමාර්ථ හා අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා සැමගේ සක්‍රිය දායකත්වය ලබා ගැනීමට
- ඉහළ කාර්ය සාධනය සඳහා සේවකයන් අභිප්‍රේණය කිරීමට
- විවිධ අංශ අතර සිමිත සේවකයින්ගේ විවිධ කටයුතු සමායෝජනය
- සංවිධානයේ විවිධ අංශ සමග සන්නිවේදනය පවත්වා ගැනීමට
- අවශ්‍ය ප්‍රතිපත්තීන් අනුව සංවිධානයේ කටයුතු පාලනයට (4×1/2 = ලකුණු 02)

(ආ) 1. අනුගාමිකයින් පිරිසක් සිටීම

2. නිශ්චිත අරමුණක් ඉටු කර ගැනීම පිණිස අනුගාමිකයින්ට බලපෑම් කිරීමට හැකි වීම.

3. අනුගාමිකයා නායකයා කෙරෙහි බලපෑම් කිරීමට ඇති ශක්තියට වඩා නායකයාට අනුගාමිකයින් කෙරෙහි බලපෑම් කිරීමට හැකි වීම.

4. අනුගාමිකයින් තම නායකයා ලෙස ඔහු පිළිගැනීම. (4×1/2 = ලකුණු 02)

(iii)(අ) අභ්‍යාස පොත් අංශයේ විචලනයක් නොමැත.

සඟරා මුද්‍රණ අංශයේ විචලනය - සඟරා 2,000 (ලකුණු 01)

(ආ) පසු පෝෂණ පාලනය (ලකුණු 01)

(ඉ) ඉදිරි පෝෂණ පාලනය (ලකුණු 01)

(ඊ) ප්‍රතිකර්මීය ක්‍රියාමාර්ග ගැනීම

නිදසුන: ඉදිරි සතියේ සේවකයන් පුහුණුවක් සඳහා යොමු කිරීමට සැලසුම් කර ඇත

(ලකුණු 01)

(iv) (අ) කාර්යක්ෂම නිෂ්පාදන ක්‍රියාවලියක් සකස් කිරීම සඳහා අවශ්‍ය භෞතික පහසුකම් එනම් කාර්ය මධ්‍යස්ථාන, ද්‍රව්‍ය, යන්ත්‍ර උපකරණ, සහාය සේවා, ආදිය සැලසුම් කිරීම කම්හල් පිරියත සැලසුම් කිරීම ලෙස හැඳින්විය හැකි ය. (පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(ආ) 1. ද්‍රව්‍ය හා යන්ත්‍ර භාවිත කිරීමේ කාර්යක්ෂමතාව වර්ධනය වීම.
2. ඉඩකඩවලින් උපරිම ප්‍රයෝජන ගැනීමට හැකි වීම.
3. ද්‍රව්‍ය භාවිත කිරීමේ පිරිවැය අඩු කර ගත හැකි වීම.
4. ද්‍රව්‍ය හා සේවකයන් චලනය වීමේ දී ඇති වන බාධා අවම වීම.
5. අනතුරු අවම වීම. (4x1/2 = ලකුණු 02)

(v) (අ) ඌන හෝ අතිරික්ත හෝ තොග ඇති නොවන ආකාරයට අවම පිරිවැයක් යටතේ රඳවා ගන්නා තොග ප්‍රමාණය ප්‍රශස්ත තොගය යනුවෙන් අදහස් වේ.
(පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(ආ) 1. ඌන තොගයක් ඇතිවීමෙන් නිෂ්පාදනය හා අලෙවි කටයුතු අඛණ්ඩ ව පවත්වාගෙන යාමට නොහැකි වීම.
2. යන්ත්‍ර සූත්‍ර හා ශ්‍රමය නිසි පරිදි භාවිත කිරීමට නොහැකි වීමෙන් අක්‍රීය පිරිවැයක් දැරීමට සිදු වීම.
3. හදිසි ඇණුවම් සපුරාලීමට නොහැකි වීම.
4. අතිරික්ත තොග ඇතිවීමෙන් තොග නශ්‍ය වීම් තොග යල්පැනීම් ඇති වීම.
5. කාරක ප්‍රාග්ධන දුෂ්කරතා ඇති වීම. (4x1/2 = ලකුණු 02)

06) (i) (අ) 1. මනා ක්‍රියාකාරිත්වය
2. කල්පැවැත්ම
3. විශ්වාසවන්තභාවය
4. ප්‍රමිතියට අනුකූල වීම (කරුණු හතරකට ලකුණු 02යි)

(ආ)

| | සිරිමල්ගේ ආයතනය | යශෝදාගේ ආයතනය |
|---|---|---|
| 1. ද්‍රව්‍ය ඵලදායිතාව | 1500/2000 = 750 | 20000/2000 = 100 |
| 2. ශ්‍රම ඵලදායිතාව | 15000/1500 = 10 | 20000/1500 = 13.3 |
| 3. යන්ත්‍ර ඵලදායිතාව | 15000/1500 = 10 | 20000/1500 = 13.3 |
| 4. පූර්ණ ඵලදායිතාව | 15000/5000 = 3 | 20000/5000 = 4 |

(ගණනය කිරීමට ලකුණු 02යි)

(ii) (අ) සඳුන් - නිෂ්පාදන සංකල්පය
කසුන් - ගනුදෙනුකරු සංකල්පය
චලනි - අලෙවිකරණ සංකල්පය

(ආ) අවශ්‍යතා හා වුවමනා - අවශ්‍යතාව - අධ්‍යාපනය හා විනෝදය

වුවමනා - තොරතුරු දැනගැනීම, විවේකය ඵලදායීව ගත කිරීම, රසවින්දනය

පිරිවැය - ගෙවන මිලට උපරිම තෘප්තිය

පහසුව - ආසන්නතම වෙළෙඳසැලෙන් මිල දී ගැනීම, මුදල් ගෙවීමේ පහසුව

සන්නිවේදනය - නවමාදිලිය, සන්නම, ප්‍රමාණය, නවීන අංගෝපාංග පිළිබඳ තොරතුරු

(ලකුණු 02යි)

(iii) 1. පාරිභෝගික වුවමනා ප්‍රශස්ත මට්ටමෙන් ඉටු වන අයුරින් නිෂ්පාදිතයක් වෙළෙඳ පොළට ඉදිරිපත් කිරීමට හැකි වීමෙන් පිරිවැටුම වැඩි කර ගැනීමට හැකි වීම.

2. නිෂ්පාදිතයට තරගකාරිත්වයට මුහුණ දිය හැකි ආකාරයෙන් මිලක් නියම කිරීමෙන් පාරිභෝගිකයා ආකර්ෂණය කර ගත හැකි වීම.

3. විවිධ ප්‍රවර්ධන උපක්‍රම භාවිත කරමින් භාණ්ඩ මිල දී ගැනීමට පොලඹවා ගැනීමට හැකි වීම.

4. පාරිභෝගිකයාට නිෂ්පාදිත වඩාත් පහසුවෙන් ආසන්නතම ස්ථානයෙන් මිල දී ගත හැකි වන සේ එම නිෂ්පාදිත බෙදා හැරීම.

5. සමස්තයක් ලෙසට ආයතනයේ අරමුණු ඉටු කර ගැනීමට අලෙවිකරණ මිශ්‍රයේ සියලු විචල්‍ය උපකාරී වේ. (ලකුණු 04යි)

(iv) (අ) සන්නම (ලකුණු 02යි)

(ආ) 1. සන්නම් නාමයෙන්ම ඉල්ලුම් කළ හැකි වීම

2. ව්‍යාජ නිෂ්පාදන මිල දී ගැනීමෙන් වැළකී සිටිය හැකි වීම

3. ගුණාත්මයෙන් ඉහළ භාණ්ඩ මිල දී ගත හැකි වීම.

4. පහසුවෙන් හඳුනා ගත හැකි වීම. (4 x 1/2 = ලකුණු 02යි)

(v) (අ) ශුද්ධ ලාභ අනුපාතය = බදු පෙර ශුද්ධ ලාභය / විකුණුම් x 100

<u>සී/ස සියල් සමාගම</u>

50000/600000 x 100

8.3%

<u>සී/ස විමල් සමාගම</u>

60000/300000 x 100

20%

(ගණනය කිරීමේ ක්‍රමය පමණක් නිවැරදි නම් ලකුණු 01යි)

(නිවැරදි පිළිතුරට ලකුණු 01යි)

(ආ) සී/ස විමල් සමාගම

ආයෝජිත ප්‍රාග්ධනයට සාපේක්ෂ ව උපයා ඇති ශුද්ධ ලාභ අනුපාතය ඉහළ අගයක් ගැනීම.

(නම් කිරීමට ලකුණු 01යි)

(පැහැදිලි කිරීමට ලකුණු 01යි)

07) (i) (අ) S & P ශ්‍රී ලංකා 20 දර්ශකය හා සියලු කොටස් මිල දර්ශකය කොටස් මිල වෙනස්වීම පදනම් ව සකස් කරන නමුත් මුළු ප්‍රතිලාභ දර්ශකය කොටස් මිල වෙනස් වීම හා ලාභාංශ ආදායම යන සාධක දෙක ම සැලකිල්ලට ගනිමින් සකස් කරයි. (පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(ආ)1. වෙළෙඳපොළ ප්‍රාග්ධනීකරණය

2. ද්‍රවශීලතාව

3. මූල්‍ය ශක්‍යතාව (එක් නිර්ණායකයක් නම් කිරීමට ලකුණු 1 බැගින් ලකුණු 02යි)

(ii) (අ) මුදල් අයවැය ලේඛනයක් හා ව්‍යාපාරයක අනාගතය මගින් අපේක්ෂිත ලැබීම් හා ගෙවීම් පෙන්නුම් කරන පුරෝකථනයක් වන අතර සත්‍ය වශයෙන් ම සිදු වූ නැති නම් අතීත මුදල් ලැබීම් හා ගෙවීම් ඇතුළත් වාර්තාවක් (ප්‍රකාශයක්) මුදල් පොතක් වේ.

(පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(ආ) 1. අභ්‍යන්තර විදේශ විනිමය මුදල් වෙළෙඳපොළ

2. අන්තර් බැංකු ඒක්ෂණ මුදල් වෙළෙඳපොළ

3. එතෙර බැංකු කටයුතු වෙළෙඳපොළ

4. මහ බැංකු ප්‍රති මිල දී ගැනුම් වෙළෙඳපොළ

5. භාණ්ඩාගාර බිල්පත් ප්‍රථමික හා ද්විතීයික වෙළෙඳපොළ

6. භාණ්ඩාගාර බිල්පත් සඳහා මහ බැංකුවේ ප්‍රති මිල දී ගැනුම් හා ප්‍රති විකුණුම් වෙළෙඳපොළ

7. වාණිජ පත්‍රිකා වෙළෙඳපොළ

8. වාණිජ බැංකුවල කෙටි කාලීන ණය වෙළෙඳපොළ (4 x 1/2 = ලකුණු 02යි)

(iii)(අ) සංවේතන යනු වේතන, දිරිදීමනා සහ අනෙකුත් වක්‍ර ප්‍රතිලාභවල එකතුවයි. නමුත් වේතන යනු සංවිධානයක් සිය සේවා දායකයින්ට ඍජුව ම ගෙවනු ලබන ගෙවීම් වන අතර එය සංවේතනවල එක් මූලිකාංගයක් පමණි. මේ අනුව සංවේතන යනු වේතනවලට වඩා වැඩි දෙයකි. (පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(ආ) 1. සේවක අභිප්‍රේරණය සිදුවීම

2. සේවක ඵලදායිතාව ඉහළ යාම

(ඉහත කරුණු දෙක පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(iv) (අ) කිසියම් පුද්ගලයෙකු සිය ජීවිත කාලය තුළ සිදු කරනු ලබන සියලුම ආකාරයේ රැකියාවන් සිය වෘත්තීය ජීවිතය ලෙස හඳුන්වනු ලබයි. මෙම වෘත්තීය ජීවිතය සංවර්ධනයට මෙන්ම මනාව පවත්වා ගෙන යාමට ද ඇති හැකියාව වෘත්තීය ජීවිතය කළමනාකරණය ලෙස හඳුන්වයි.

(පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(ආ) 1. රැකියාව ආශ්‍රිත හේතු
2. සේවා තත්ත්වයන් ආශ්‍රිත හේතු
3. මානව සම්පත් කළමනාකරණ ප්‍රතිපත්ති, ක්‍රියාපටිපාටි හා උපාය මාර්ගවලට අදාළ හේතු
4. සංවිධාන නීතිරීති උල්ලංඝනය කිරීම්වලට අදාළ හේතු
5. නුසුදුසු පුද්ගල චර්යාවන් සම්බන්ධිත හේතු (4 x 1/2 = ලකුණු 02යි)

(v) (අ) 1. ආයතනයේ දේපලවලට හිතාමතා හානි සිදු කිරීම.
2. පූර්ව අවසරයකින් තොරව සේවයට වාර්තා නොකිරීම.
3. ප්‍රමාද වී සේවයට පැමිණීම.
4. රැකියා ස්ථානයෙන් අවසර නොමැතිව බැහැර වීම.
5. ව්‍යාජ අසනීප ගති පෙන්වීම.
6. සේවයේ නියුක්තව සිටිය දී නිදා ගැනීම.
7. රැකියා කටයුතු පිළිබඳ නොසැලකිල්ල හා මන්දෝත්සාහී වීම.
8. ස්ථාපිත කර ඇති ආරක්ෂිත හා සෞඛ්‍ය ක්‍රමවලට බාධා කිරීම.
9. සේවා නියුක්තව සිටින විට මත්වතුර හෝ මත් ද්‍රව්‍ය භාවිත කිරීම.
10. මුදල් වංචා කිරීම හෝ අල්ලස් ගැනීම.
11. ප්‍රධානයා හා තම සේවකයන්ට අපහාස කිරීම හෝ තර්ජනය කිරීම. (4x1/2 = ලකුණු 02යි)

(ආ) 1. වාචික ව අවවාද කිරීම.
2. ලිඛිත ව අවවාද කිරීම.
3. දඩ ගැසීම හෝ අලාභය අයකර ගැනීම.
4. වේතන රහිත ව තාවකාලික ව වැඩ තහර කිරීම.
5. විනයානුකූල ව සේවා ස්ථානය මාරු කිරීම.
6. වැටුප් වර්ධක නතර කිරීම හෝ ප්‍රමාද කිරීම.
7. තනතුරෙන් පහත හෙළීම.
8. සේවයෙන් ඉවත් කිරීම. (4x1/2 = ලකුණු 02යි)

08) (i) (අ) 1. සේවක වන්දි රක්ෂණය සඳහා වන වාරික ඉහළ යාම
2. සේවක වන්දි ගෙවීම් ඉහළ යාම
3. නීතිමය වියදම් ඉහළ යාම
4. සේවක අතෘප්තිය සහ අසහනය ඇති වීම
5. සේවක ඵලදායකත්ව පහත වැටීම
6. සේවක ගුණාත්මක බව පහළ යාම

7. උපකරණවලට සිදු වන අලාභහානි වැඩි වීම
8. අනවශ්‍ය ලෙස වෛද්‍ය වියදම් ඉහළ යාම
9. ආයතනයේ කීර්තිනාමයට හානි පැමිණීම
10. සේවක ප්‍රවාසීතාව ඉහළ යාම
11. සේවක පිරිවැටුම ඉහළ යාම (4 x 1/2 = ලකුණු 02යි)

(ආ) සේවාදායකයන්ට
1. නියමිත පරිදි වැටුප් නොලැබී යාම හෝ ප්‍රමාද වීම.
2. ජීවන තත්ත්වය පහත වැටීම.
3. කාර්මික සාමය බිඳ වැටීම මගින් සුහදතාවය පළුදු වීම.
4. අනාගත උසස් වීම්, පුහුණුවීම්, ශිෂ්‍යත්ව වැනි වෘත්තීය සංවර්ධන තත්ත්වයන්ට බාධා ඇති වීම. (ලකුණු 02යි)

පාරිභෝගිකයන්ට
1. අදාළ භාණ්ඩ හා සේවාවල මිල ඉහළ යාම.
2. වෙළෙඳ පොළේ භාණ්ඩ හිඟයන් ඇති වීම.
3. සුපුරුදු භාණ්ඩ පරිභෝජන අවස්ථා අහිමි වීම.
4. ගුණත්වයෙන් අඩු ආදේශක භාණ්ඩ පරිභෝජනයට සිදු වීම. (ලකුණු 02යි)

(ii) (අ) ව්‍යුහගත තීරණ යනු කලින් තීරණය කර ගත් ආකෘතියකට අනුව කිසියම් විසඳුමක් ලබා දීම.
නිද. ආර්ථික ඇණවුම ප්‍රමාණය ගණනය කිරීම.
ව්‍යුහගත නොවන තීරණ යනු පෙර තීරණය කරන ලද ආකෘතියකින් තොරව හදිසියේ පැන නගින අවස්ථා සඳහා ගනු ලබන තීරණයි.
නිදසුනඃ ක්ෂණික ඇණවුම් සපුරාලීමට හදිසි මිල දී ගැනීම්
(පැහැදිලි කිරීමට ලකුණු 01යි)
(නිදසුන් දැක්වීමට ලකුණු 02යි)

(ආ) 1. රූපමය දත්ත - භාණ්ඩවල ඡායාරූප
2. සංඛ්‍යාමය - භාණ්ඩවල මිල ගණන්
3. ශ්‍රව්‍යමය - පටිගත කරන ලද පාරිභෝගික අදහස්
4. දෘශ්‍යමය - විල ගණන් දැක්වෙන නාම පුවරු (4 x 1/2 = ලකුණු 02යි)

(iii) (අ) 1. අදහස් type කර අනෙක් පාර්ශ්වයට යැවීම. (ලිඛිත කථන)
2. වාචික ව අදහස් හුවමාරු කර ගැනීම. (හඬ කථන)
3. වෙබ් කැමරා භාවිත කරමින් ශබ්දයට අමතරව දර්ශන හුවමාරු කර ගැනීම. (වීඩියෝ කථන) (ලකුණු 02යි)

(ආ) 1. පොත්පත් පරිශීලනය කිරීමට හැකියාව
2. ව්‍යාපෘති සඳහා තොරතුරු රැස් කර ගත හැකි වීම
3. මාර්ග ගත ක්‍රමයට අධ්‍යාපනය ලැබීමට
4. විෂය කරුණු අන්තර්ජලය හරහා බාගත කළ හැකි වීම
5. අධ්‍යාපනය සඳහා ගෙවීම් සිදු කළ හැකි වීම. (4x1/2 = ලකුණු 02යි)

(iv) (අ) ව්‍යාපාරය කුමක් ද යන්න හා ව්‍යාපාරය සපයනු ලබන භාණ්ඩ හෝ සේවා පිළිබඳ විස්තරත්, එමගින් ගනුදෙනුකරුවන්ට ලැබෙන ප්‍රතිලාභත් එහි සුවිශේෂත්වයත් විස්තර කෙරෙන කොටසයි. (පැහැදිලි කිරීමට ලකුණු 02යි)

(ආ) 1. ව්‍යාපාරයේ නම හා ලිපිනය
2. ව්‍යාපාරයේ පරමාර්ථ හා අරමුණු
3. ව්‍යාපාර ඉතිහාසය
4. භාණ්ඩ හා සේවා පිළිබඳ විස්තර
5. මුළු ආයෝජනය (4x1/2 = ලකුණු 02යි)

(v) 1. ව්‍යාපාර සමාජ වගකීම් ඉටු කිරීම
2. අපේක්ෂිත අමුද්‍රව්‍ය සහ ඒවා නියමිත වෙලාවට ලබා ගත හැකි ද යන්න.
3. අපේක්ෂිත ව්‍යාපාරය ක්‍රියාත්මක කළ හැකි ද යන්න
4. නෛතික තත්ත්වයන්ට අනුකූල බව
5. පරිසර හිතකාමී බව
6. සැලසුම අනුව ආරම්භ කිරීමේ හා පවත්වා ගෙන යාමේ හැකියාව (4x1/2 = ලකුණු 02යි)